1980 -12- 22

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 31 දරන
# ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 අගෝස්තු මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 ඔක්තෝබර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක

මිළ : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 35 යි

# 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත

[සහතිකය සටහන් කළේ 1980 අගෝස්තු මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 126/78

**ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන ආණ්ඩුවේ ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒවා පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; එවැනි සංවිධානවල කටයුතු ඒකාබද්ධ කිරීම පහසු කිරීම පිණිස ද; නියමාකාරව ස්ථාපිත එවැනි සංවිධාන ආණ්ඩුව විසින් පිළිගනු ලැබීම පිණිස ද; ඒ සංවිධානවල පවත්නා රීති යටතේ මුදල් සහ ප්‍රතිපත්ති පාලනය සම්බන්ධයෙන්, ඒ සංවිධානවල සාමාජිකයන්, මහජනතාව සහ ආණ්ඩුව කෙරෙහි වූ ඒ සංවිධානවල වගකීම ක්‍රියාවේ යෙදවීම පිණිස ද; ඒ සංවිධාන ලෙසට පෙනී සිටින තැනැත්තන් විසින් අයථා ක්‍රියාවල යෙදීම වැළැක්වීම පිණිස ද; නීතියෙන් පිළිගෙන නොමැති ස්වේච්ඡා සමාජ සේවා කණ්ඩායම් ස්ථාපනය විධිමත් කිරීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.**

**1.** මේ පනත 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු “ නියමිත දිනය ” යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

**නිලධරයන් පත් කිරීම.**

2. (1) මේ පනතේ කාර්ය සඳහා (මෙහි මින් මතු “ රෙජිස්ට්‍රාර්වරයා ” යනුවෙන් හඳුන්වනු ලබන) ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයකු, නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍යවන තරම් ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරුන් හා සහකාර රෙජිස්ට්‍රාර්වරුන් සහ වෙනත් නිලධරයන් සංඛ්‍යාවක්, නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(3) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී ද කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී ද සෑම නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයකු හෝ සෑම සහකාර රෙජිස්ට්‍රාර්වරයකු රෙජිස්ට්‍රාර්වරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත් විය යුතු ය.

(4) මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ රෙජිස්ට්‍රාර්වරයා වෙත සතු කරන ලද, පවරන ලද, හෝ නියම කරන ලද බලතල, කාර්ය හෝ කර්තව්‍ය සියල්ලම හෝ ඉන් කිසිවක්, සෑම නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයකු හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරයකු විසින් ම තම බල සීමාව ඇතුළත, රෙජිස්ට්‍රාර්වරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැකි ය.

**ලියාපදිංචි කිරීමට නියමිත සංවිධාන.**

**3.** මෙහි මින් මතු අඩංගුව ඇති විධිවිධානවලට යටත්ව, (මෙහි මින් මතු “ ස්වේච්ඡා සංවිධානය ” යනුවෙන් හඳුන්වනු ලබන) සෑම ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් ම මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

ඒ—45014—9,600 (79/10)

ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

4. මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම රෙජිස්ට්‍රාර්වරයා වෙත නියමිත ආකෘතියෙහි ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර නියම කරනු ලැබිය හැකි ලේඛන ද ඒ සමග එවනු ලැබිය යුතු ය. ස්වේච්ඡා සංවිධානයේ ලේකම්වරයා විසින් ඒ ඉල්ලුම් පත්‍රය අත්සන් කරනු ලැබිය යුතු ය.

ලියාපදිංචි කිරීම.

5. ස්වේච්ඡා සංවිධානයක්, මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කර ඇති බවට රෙජිස්ට්‍රාර්වරයා විසින් සෑහීමට පත් වුවහොත් ඔහු විසින් ඒ සංවිධානය ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අභියාචනා කිරීම.

6. යම් ස්වේච්ඡා සංවිධානයක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරමින් රෙජිස්ට්‍රාර්වරයා විසින් කරන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ ප්‍රතික්ෂේප කිරීමෙන් දින තිහක් ඇතුළත ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව, සමාජ සේවා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

ලියාපදිංචි කිරීම පිළිබඳ සාක්ෂි.

7. අදාළ ස්වේච්ඡා සංවිධානයේ ලියාපදිංචි කිරීම අවලංගු කර ඇති බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, රෙජිස්ට්‍රාර්වරයා විසින් අත්සන් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක්, එහි සඳහන් ස්වේච්ඡා සංවිධානය යථා පරිදි ලියාපදිංචි කරන ලද බවට තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

ස්වේච්ඡා සංවිධානයේ ලිපිනය.

8. මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද සෑම ස්වේච්ඡා සංවිධානයකට ම, ඒ සංවිධානයේ රීතිවලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කරන ලද්දා වූ ද සියලුම දැන්වීම් හා සංදේශන භාරදිය හැකි වූ ද ලිපිනයක් තිබිය යුතු අතර ඒ ලිපිනය යම් විටක වෙනස් වුවහොත් ඒ වෙනස සිදු වී දින හතක් ඇතුළත ඒ වෙනස ගැන රෙජිස්ට්‍රාර්වරයාට දැන්විය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයාගේ බලතල.

9. රෙජිස්ට්‍රාර්වරයාට හෝ, රෙජිස්ට්‍රාර්වරයා විසින් තත් කාර්යය සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද යම් නිලධරයකුට පහත සඳහන් ක්‍රියා කිරීම සඳහා බලය තිබිය යුතු ය :—

(අ) මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා සංවිධානයක සතුටුදායක සේවා තත්ත්වයක් පවත්වා ගෙන යන්නේ දැයි නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා ඒ සංවිධානයේ පරිශ්‍රයට දිවා කාලයේ සියලු සාධාරණ වේලාවල දී ඇතුළුවීම සහ සෝදිසි කිරීම ;

(ආ) ඒ සංවිධානය විසින් කරන ලද වංචාවක් හෝ අරමුදල් වියපහරණයක් හෝ පිළිබඳ කිසියම් චෝදනාවක් අමාත්‍යවරයා වෙත දැනුම් දීම ;

(ඇ) ඒ සංවිධානයේ විධායක කමිටුවේ සියලු සාමාජිකයන්ගේ හෝ සාමාජිකයන් බහුතරයක ලිඛිත ඉල්ලීම මත හෝ, ඒ සංවිධානයේ නිලධරයන්ගේ නැතහොත් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හෝ, ඒ සංවිධානයේ විධායක කමිටුවේ යම් රැස්වීමකට හෝ ඒ සංවිධානයේ මහ සභා රැස්වීමකට පැමිණීමට, එසේ පැමිණෙන රෙජිස්ට්‍රාර්වරයාට හෝ නිලධරයාට හෝ ඒ රැස්වීමේ දී ඡන්දය දීමට අයිතිය නැත්තේ ය ;

(ඈ) සෑම අවුරුද්දකට ම යටත් පිරිසෙයින් එක් වරක්වත් නියමිත ආකාරයට ඒ සංවිධානයේ ගිණුම් විගණනය කිරීම හෝ විගණනය කිරීමට සැලැස්වීම.

**අමාත්‍යවරයා විසින් ඇතැම් කාරණා පරීක්ෂණ මණ්ඩලයට යොමු කළ හැකි බව.**

10. මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා සංවිධානයක් සම්බන්ධයෙන් වංචාවක් හෝ ව්‍යාපහරණයක් හෝ පිළිබඳ යම් චෝදනාවක් යම් තැනැත්තකු විසින් කරනු ලබන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඒ කාරණාව පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කරනු ලැබිය හැකි ය.

**පරීක්ෂණ මණ්ඩලය.**

11. (1) රජයේ නිලධරයන් නොවන වැදගත් තැනැත්තන් හය දෙනකුගෙන් සමන්විත මූල මණ්ඩලයක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් මේ පනතේ කාර්ය සඳහා, පරීක්ෂණ මණ්ඩලයක් හෝ පරීක්ෂණ මණ්ඩල ස්ථාපනය කරනු ලැබිය හැකි ය. එක් එක් මණ්ඩලය මූල මණ්ඩලයෙන් තෝරා ගත් සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත වන්නේ ය. පරීක්ෂණ මණ්ඩලයක සභාපතිවරයා ලෙස අමාත්‍යවරයා විසින් එක් සාමාජිකයකු නම් කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා නිර්ණය කරනු ලබන පාරිශ්‍රමිකයක් පරීක්ෂණ මණ්ඩලයක සාමාජිකයන් වෙත ගෙවනු ලැබිය යුතු ය.

**පරීක්ෂණ මණ්ඩලය විසින් පරීක්ෂා කොට වාර්තා කළ යුතු බව.**

12. (1) යම් කාරණාවක්, 10 වන වගන්තිය යටතේ පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කරනු ලැබූ අවස්ථාවක, ඒ මණ්ඩලය විසින් ඒ කාරණාව පරීක්ෂා කොට අමාත්‍යවරයා වෙත වාර්තාවක් සැපයිය යුතු ය.

(2) එවැනි මණ්ඩලයක් වෙත යොමු කරන ලද යම් කාරණාවක් විභාග කිරීම සහ එහි කටයුතු නිම කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය, තත් කාර්යය සඳහා සාදන ලද නියෝගවලට අනුකූල විය යුතු ය.

(3) පරීක්ෂණය නිම කිරීමෙන් පසු දින දහ හතරක් ඇතුළත ඒ මණ්ඩලය විසින්, ස්වකීය නිරණ පිළිබඳ වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

**පරීක්ෂණ මණ්ඩලයේ බලතල.**

13. 12 වන වගන්තිය යටතේ වූ පරීක්ෂණයක කාර්ය සඳහා පරීක්ෂණ මණ්ඩලයකට පහත දැක්වෙන කටයුතු කිරීමේ බලය තිබිය යුතු ය:—

(අ) සාක්ෂිකරුවන් කැඳවීම සහ පැමිණෙන ලෙස ඔවුන්ට බල කිරීම,

(ආ) ලේඛන ඉදිරිපත් කරන ලෙස බල කිරීම,

(ඇ) යම් තැනැත්තකු ලවා දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් කරවීම.

අමාත්‍යවරයා විසින් වාර්තාව උචිත අධිකාරිය වෙත යොමු කළ යුතු බව.

14. 12 (3) වන වගන්තියෙහි නියම ප්‍රකාර පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව තමා වෙත ලැබුණු විට, අමාත්‍යවරයා විසින්, ඒ වාර්තාව නීතිය අනුව පියවර ගැනීම සඳහා උචිත අධිකාරිය වෙත යොමු කළ යුතු ය.

නියෝග.

15. (1) නියම කරනු ලැබීමට මේ පනතින් නියමිත යම් කාරණා සම්බන්ධයෙන් හෝ, යම් කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබීමට මේ පනතින් බලය ලැබී ඇත් ද ඒ කාරණා සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දින යෙහි හෝ ඒ නියෝගයේ සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන්නේ යම් දිනයක සිට ද ඒ දිනය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

මේ පනතට අනුකූලව ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

16. (1) රෙජිස්ට්‍රාර්වරයාට හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් යථා පරිදි බලය දෙන ලද වෙනත් තැනැත්තකුට හෝ මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය යම් ක්‍රියාවක් කිරීම නැතහොත් යම් තොරතුරක් සැපයීම ඕනෑකමින් ම අතපසු කරන හෝ ප්‍රතික්ෂේප කරන හෝ සෑම තැනැත්තකු ම සහ, මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද යම් සිතාසියකට නැතහොත් නීත්‍යනුකූල ලිඛිත නියමයකට ඕනෑකමින් ම හෝ සාධාරණ හේතුවක් නොමැතිව හෝ අවනත නොවන නැතහොත් මේ පනතේ විධිවිධාන යටතේ තොරතුරු සපයන ලෙස නියම කිරීමට බලය ඇති තැනැත්තකුට නීත්‍යනුකූලව අවශ්‍ය වන යම් තොරතුරක් සැපයීම පැහැර හරින සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් වරදක් සිදු කරන සෑම තැනැත්තකු ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයෙන් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසිය පණහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**නිලධරයන් ආරක්ෂා කිරීම.**

17. මේ පනත යටතේ ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමේ දී සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සඳහා මේ පනත යටතේ පත් කරන ලද යම් නිලධරයකුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

**අර්ථ නිරූපණය.**

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"ප්‍රජා නිවාස" යන්නෙන්, තැනැත්තන් සමූහයක් විසින් ස්වේච්ඡා පදනමක් මත පිහිටුවා ගනු ලැබූ සංවිධානයක් විසින් යම් තැනැත්තකුට ලබා දුන්නා වූ ද වාසස්ථානය තුළ පදිංචිව සිටින තැනැත්තන් සඳහා ආහාර සහ වෙනත් පහසුකම් සපයන වාසස්ථානයක් වන්නා වූ ද යම් වාසස්ථානයක් අදහස් වේ; සහ

"ස්වේච්ඡා සමාජ සේවා සංවිධානය" යන්නෙන් තැනැත්තන් කණ්ඩායමක් විසින් ස්වේච්ඡා පදනමක් මත පිහිටුවා ගනු ලැබුවා වූ ද—

(අ) ආණ්ඩුවේ නොවන ස්වභාවයක් ඇත්තා වූ ද;

(ආ) ස්වකීය කර්තව්‍ය කර ගෙන යාමේ දී මහජන දායක මුදල්, ප්‍රණාධාර, ආණ්ඩුව විසින් ගෙවනු ලබන ආධාර මුදල් සහ දේශීය සහ විදේශීය පරිත්‍යාග මත යැපෙන්නා වූ ද;

(ඇ) මානසිකව දුබල වූවන් හෝ ශාරීරික අශක්‍යතාවනට පත්වූවන්, දිළින්දන්, අනාථයන් සහ අසරණයන් සඳහා අවශ්‍ය වන සහනාධාර සහ සේවා සැලසීම ද ස්වභාවික ව්‍යසන කාලවල දී සහනාධාර සැලසීම ද ස්වකීය ප්‍රධාන අරමුණු ලෙස ඇත්තා වූ ද

යම් සංවිධානයක් අදහස් වන අතර, ඊට ප්‍රජා නිවාසයක් ද ඇතුළත් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.